## කවි කොළය

# අවසන් සටන

සදහම් දිවයිනෙහි සිංහළ දෙමළ දෙක
එකිනෙක ගැටී ඇතිකරගෙන සිතෙහි සැක
ජීවිත දහස් ගණනින් මිය ඇදෙනු දැක
ජනපතිතුමාගේ ඇති වී සිතෙහි දුක

පෙර දුටුගැමුණු මෙන් ගොස් යුදපිටිය කරා
කැඳවා වේලුපිල්ලේ නම් කපටි හොරා
මුහුණට මුහුණ සටනක් කොට රුහිරු පෙරා
සාමය රටට දෙන අදහස සිතෙහි දරා

පණිවුඩ යවා වන්නියෙ මහ කොටි යාට
කිසියම් තැනක්, දිනයක් වෙන්කොට ඊට
දැනගනු පිණිස තොරතුරු මහජන යාට
ටී වී ඇඩ් දමා හවසට මහ රෑට

ඇරඹුණි සටන හරියට කණිසමට අටේ
දිළිසෙන පලිහ සහ හෙල්ලද ඇතිව මිටේ
ජනපති නැගී එයි! නිල්වන් ඇතෙකු පිටේ
රැස්වී සිටිති කෙළ දහසක් සෙනග වටේ

කොටි කට සහිත අති බිහිසුනු කොඩිය දරා
ලේ වැකි හෙල්ල ගෙන ඩා දිය මුගුරු පෙරා
අමුඩය ගසා අලු තවරා නළල පුරා
දැන් එයි වේලුපිල්ලේ කළු ඇතෙකු අරා

මහ රා සැළක් මෙනි පිම්බී තිබෙන බඩ
කකුලේ තුවාලය ඇත ඔඩු දුවපු හැඩ
මහ කොටි රාළ රැඳෙමින් අලි සිරස උඩ
පෙන්වයි එළාරගෙ අන්තිම සටනෙ වැඩ

මේ අවි සටන කෙලෙසක විය හැකිද නිමා
ලොවටම වහා දිය යුතු මෙය නැතිව පමා
කැමරා මානමින් තඩි ලෙන්සයද දමා
රොයිටර් පොටෝකරුවෝ වෙති දෑස යොමා

අවසානයේ ජනපති බලමින් එල්ල
හෙණ වේගයද පරදා විසිකළ හෙල්ල
ගලවාගෙන ගොසින් මහ කොටියගෙ බෙල්ල
ඇද වැටුණෝය හරහා නිල් තණ නිල්ල

රතු කුරුසයෙන් අහුලා
හිස නොමැති කුණ
වන්නියෙ කැලෑවට ගෙන
ගොස් තැබුව තැන
එකතුව එකට එන් ජී ඕ
සියළු දෙන
දෙන්නට හදයි හිසනැති
මළකඳට පණ



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

## කොළඹ විත්ති








# රුපියල් දසලක්ෂ 900 ක් වංචාකර රටෙන් පැනගිය 'සක්විති සර්'

**ස**ක්විති රණසිංහ නම් පුද්ගලයා ලංකාව පුරා හැඳින් වුණේ **ඉගැන්වීමට උපන් ඉංග්‍රීසි ගුරුවර සක්විති සර්** යන අන්වර්ථ නාමයෙනි. එය ඔහු ඔහුටම පිරිනමාගත් විශේෂණ පදයකි. **මා උපන්නේ ඉගැන්වීමටය** යන්න ඔහුගේ ප්‍රචාරක පෝස්ටර්වල සඳහන්වීය. මේ තැනැත්තා ඉංග්‍රීසි ඉගැන්වීමට අමතරව නුගේගොඩ නාවල පාරේ අංක **8** දරණ තැන **සක්විති ගෘප්** යනුවෙන් මුදල් තැන්පත්කරන ආයතනයක් අරඹා බැංකුවටත් වඩා වැඩි ලාභ ලබන්නට තමා ළඟ මුදල් තැන්පත් කරන ලෙස මහජන යාට කීවේය. ඔහුගේ බසට රැවටුණු මිනිස්සු තම ජීවිත කාලයේම ඉතුරු කළ මුදල් ද වතුපිටි ඉඩම් විකුණා ඒ මුදල් ද ලක්ෂ දසලක්ෂ ගණනින් සක්විති ගෘප් හි තැන්පත් කළෝය. සති තුනකට පෙර සක්විති සර් ඒ තැන්පතු රුපියල් කෝටි නවයක් ද සමග මුළු පවුලම කැටුව රටෙන් පැන ගොස් ඇත.

මේ හොර සක්විත්තා නම් හයකින් පෙනී සිටි අයෙකි. අභයරණසිංහ මුදියන්සේලාගේ චන්දන වීරකුමාර, ඒ. එම්. සී. වීරකුමාර, ආර්. වී. එස්. වීරකුමාර, චන්ද්‍රකුමාර රණසිංහ, දේශමාන්‍ය සක්විති රණසිංහ සහ සක්විති රණසිංහ සර් ඒ නාමයන් හය වෙයි.



සක්විති රණසිංහ



එඩ්වින් ආරියදාස

වසාදමා ඇති නුගේගොඩ සක්විති ගෘප් බිල්ඩිම ඉදිරිපිට රැවටුණු අය තවමත් බලා සිටින අන්දමය මේ. පැමිණිලි කරන්නට මිරිහාන පොලීසියට පැමිණි වංචාවෙන් විපතට පත් වූ පිරිස

ශ්‍රීලංකාවේ ජාතික රූපවාහිනියේ ඉරිදා හවස සක්විතිගේ ඉංග්‍රීසි පාඩමට විශාල ප්‍රචාරයක් ලැබුණි. ඒ මගින් ඔහුගේ ඉංග්‍රීසි පන්තිවලට විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් ලැබිණ. මම ඉගැන්වීමට උපන් අයෙකි යන්න ඔහු ආදර්ශ පාඨය හැටියට යෙදුවේය. ඔහුගේ සක්විති ගෘප් ගැන ජනතාව පැහැදෙන්නට හේතුව එය විය හැකිය. එසේම ඔහු එම ආයතනයේ අධ්‍යක්ෂකවරයෙකු හැටියට රුපියල් ලක්ෂයක පඩියකට ප්‍රවීන පත්‍ර කලාවේදියෙකු වන එඩ්වින් ආරියදාස මහතා ද බඳවා ගත්තේය. සක්විති කළ තවත් කපටි වැඩක් නම් එඩ්වින් ආරියදාස සහ ශ්‍රීලංකා ජනාධිපතිවරයා තමාගේ දෙපසේ සිටින විශාල ඡායාරූපයක් ද කායර්‍යාලයේ ගසාගැනීමයි. මිනිසුන් තුළ විශ්වාසය තවත් වැඩිවිය.

සක්විති රණසිංහගේ ව්‍යාපාර අතර ගෙවල් හා ඉඩම් මිළට ගැනීම් හා විකිණීම් විය. එසේම ඔහුගේ ආයතනයේ රුපියල් ලක්ෂයක් ආයෝජනය කළවිට මාසික පොලිය රුපියල් 4000-6000 අතර මුදලක් ගෙවන බව ද සඳහන්කර තිබුණි. මේ ගෙවීම් සාමාන්‍ය පිළිගත් බැංකුවල ගෙවන මුදලට වඩා වැඩි නිසා ලාංකික ජනතාව දෙවරක් නොසිතා රුපියල් ලක්ෂගණන් වලින් සක්විති සමාගමේ මුදල් තැන්පත් කළෝය. පොලීසියෙන් ප්‍රශ්නකළ විට එඩ්වින් ආරියදාස කියන්නේ තමා මෙම වංචනික තත්වය කිසිත් නොදැන සිටි බවයි.

සක්විති පමණක් නොව අහිංසක මිනිසුන් ගසාකන මෙවැනි කපටි ආයතන කීපයක්ම ශ්‍රීලංකාව තුළ ක්‍රියාත්මක වනබව මධ්‍යම බැංකුව කියයි. එසේ නම් ඒ කපටින් මර්දනය කිරීම රජයේ යුතුකම නොවන්නේදැයි ජනතාව අසති.

♦ කීර්ති



**ඉරිදා**- ළඟදි රත්නපුරේට යූ ඇන්පී එකෙන් මහ ඇමති
**SUN** තනතුරට ඉල්ලපු රන්ජන් රාමනායක එහේ රැස්වීම්වල කියලා තිබුණා, එයා රත්නපුරේ බින්නබහින්න කැමතිය කියලා. ඒක අහලා රන්ජන්ට රත්නපුරෙන් හොඳ පොහොසත් තැන් වලින් මංගල යෝජනා සිය ගණනක් ඇවිල්ලයි කියල පත්තරේ තිබුණුබව කැතරින් කුඩම්මා ටෙලිපෝන් කරපු වෙලාවෙ කිව්වා. ඔක්කොම මැණික් බිස්නස්කාරයින්ගෙ දූලා. සමහර යෝජනා වල කේන්දර කොපියටම අමුණලා තව පොඩි තුණ්ඩු කැල්ල කුත් එවලා තිබුණලු අනාගතයෙදි රන්ජන් අධ්‍යක්ෂණය කරන චිත්‍රපටයක රඟපාන්න පුල පුල ඉන්නවයි, පාසැලේදිත් නාට්‍යවල රඟපාපු පළපුරුද්ද තියෙනවයි කියලා. එහෙම ලියලා එවලා තියෙන්නෙ අර ගෑණු ළමයි නෙවෙයි, ඒ කෙල්ලන්ගෙ අම්මලා.

**සඳුදා** - ගිය සැරේ මේ දින පොතේ මම ලිව්ව ලෝකෙ
**MON** පළමුවෙනි වතාවට පුදුම දෙයක් සිද්දවෙන්න හදනවයි, ඇමරිකාවෙ ඩිමෝක්‍රැටික් පාටියෙන් ඉල්ලන බැරක් ඔබාමා දිනුවම ඒ තමයි මුල්වරට ඇමරිකාවෙ ජනාධිපතිවෙන කලු මිනිහා කියලා. ඒ ලංකාවිත්ති පත්තරේ කියවලා වොෂිංටන්වල ඉන්න රෝහණ මල්ලි ඊමේල් එකක් එවලා මෙහෙම. “ අක්කෙ ලෝකෙට පේන්නෙ එහෙම තමයි. ඒ වුනාට හීනෙන්වත් හිතන්න එපා ඒක සිද්ධ වෙන දෙයක් කියලා. එහෙම පෙනුනට සුදු ඇමරිකන්කාරයො කීයටවත් කල්ලෙකුට ජනාධිපති වෙන්න ඉඩ දෙන්නෙ නැහැ. ඡන්දෙදි ඔබාමා පැරදිලා, රිපබ්ලිකන් පාටියෙ මැකේන් දිනනවා. තව මාසයයි නේ, බලන්න මම කියන්නෙ බොරුද කියලා. අක්කලා ඔහේ ඉන්නෙ. අපි ඉන්නෙ මෙහේ නේ.”

**කුජදා** -අපේ අගමැති ගෝඩ්න් බ්‍රවුන් හිතුවට වඩා කලින්
**TUE** අප්‍රසාදයට ලක්වෙලා. ටෝනි බ්ලෙයාර් අගමැති වෙලා ඉන්දෙද්දී උණකාරයා වතුර ඉල්ලනවා වගේ දිගටම නහයෙන් අඬ අඬ අගමැති පුටුව ඉල්ලුවා, දීපන්කො ඕක මට, දීපන්කො ඕක මට කියකිය. ඉතින් දුන්නනේ, ඔන්න දැන් බ්‍රවුන් නාගන්නවා. ටෝනි බ්ලෙයාර් හිනාවෙන පින්තූරයක් ළඟදි පත්තරේක දැක්ක වෙලාවෙ මට හිතුනෙ ඒ හිනාවෙන්නෙ බ්‍රවුන්ගැන හිතලයි කියලා. මෙච්චරකල් හොඳට ආපු ලේබර් පාටිය මේවගේ සවුත්තු වුණු කාලයක් ඉතිහාසෙ නෑ. අපේ මුත්ත කියනනවා වගේ රටක් රාජ්ජයක් කරනඑක ලේසි නෑ බොලන්.

**බුදදා-** ලංකාවෙ හරියට සර්ලා. නිහාල් සර් අද කුරුණෑ
**WED** ගලදී. අබේනායක සර් අද මහරගමදී. ෂෙල්ටන් සර් හෙට පැලවත්තේදී. ඔය විදියට තාප්ප, බෝක්කු, බිත්ති හැම තැනකම සර්ලා වැහිවැහැලා. සර් පට්ටම් දෙන මේ එංගලන්තෙවත් ලංකාවෙ තරම් සර්ලා නෑ. මෙහේ සර් කෑල්ල දාන්නෙ නමේ මුලට. ලංකාවෙ දාන්නෙ නමේ අගට. මේ හාදයො මේ ටියුෂන් මාස්ටර්ලා. මේ අස්සෙ නුගේගොඩ නාවල පාරේ හිටියා සක්විති සර්. මිනිහා රූපවාහිනියෙන් මතුවෙලා කිව්වෙ මා උපන්නේ ඉගැන්වීමටය කියලා. මැන් රුපියල් කෝටි නමයක් අරන් පැනලා ගිහින්. දැන් අහුවෙච්ච මිනිස්සු අඬඅඩා කියනවා, අනේ අපි උපන්නේ රැවටෙන්නටමය කියලා.

**ගුරුදා** - කිලිනොච්චියෙ කොටි මූලස්ථානෙට හමුදාවෙන්
**THU** පහර දීලා ඒක විනාස කරපු වෙලාවෙ දැන් ඉතින් වැඩේ වරදින්න යන බව තේරිලා ලන්ඩන්වල ඉන්න කොටි සපෝටර් දෙමළ කාණ්ඩෙ දුක්වෙන බව මෙහේ දෙමළ පත්තරේක පළවුණු ලිපියකින් දැක්කා. ඒකෙ අහනවා කොටි සංවිධානෙට පිටරට ඉන්න දෙමළ ජනතාව මෙච්චර සල්ලි එකතුකරලා දීලත් වැඩක් වුණේ නැහැ නේද කියලා. ඒ එකතුකරපු සල්ලි බාගයක් ගියේ ඒ එකතුකරපු ඇයින්ගෙ සාක්කුවලට බව මෙහේ දෙමළ අයම කියනවා. ඊළම වගේම මුන්ගෙ සේරම බොරුව.

**කිවිදා** - මේ යුද්ධයෙදි කවුරුත් කතාකරනවා වර්ණනා කර
**FRI** නවා අපේ ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය ගැන. රට ආරක්ෂාකරන්න ඒ අයගෙ කැපවීම සහ දායකත්වය ගැන. ඒක හොඳයි. ඒත් අපේ හුඟක් දෙනා කතාකරන්නෙ නැහැ උතුරෙ නැගෙණහිර මෙපමණ කාලයක් ඒ ගම්වල ආරක්ෂාවට කටයුතු කළ දිවිපිදූ ග්‍රාම ආරක්ෂක භටයො ගැන. ඒ මිනිස්සු ඒ ගම්වලම අය. ඒ මිනිස්සු එදා ඒ ගම් දාලා ගියේ නැහැ. ඒ මිනිස්සු මිනිස් පවුරක් වෙලා කොටින්ගෙන් මැරුම්කකා වුනත් හෙල්ලෙන්නෙ නැතුව ගම ආරක්ෂාකරගෙන හිටියා. අපේ පූර්ණ ගෞරවය භක්තිය ඒ අයටත් නොඅඩුව පිදිය යුතුයි.

**ශනිදා-** විමල් ළඟදි ලංකාවට ගිහින් ඇවිත් අපට කිව්වා
**SAT** ලංකාව දැන් කලින් ගිය වතාවට වඩා දියුණුය කියලා. අර පුරාණ කාලෙ තිබුණු යහපත් ලංකාවෙ තත්වෙට දැන් ඇවිල්ලයි කියලා. මෙහෙමයි එයා ඒක මැනගන තියෙන්නෙ. නුවර යන ගමන් කඩවත හරියෙදි විමල් එයාගෙ කාර් එක නවත්තලා පාරට දාන්න ඉන්න තව කාර් එකකට ඉඩදීලා. විමල් කෑගල්ලට ආවම අර කාර් කාරයාත් පස්සෙන්ම එළවගෙන ඇවිල්ලා. බලන කොට මොකටදඇවිත් තියෙන්නෙ? තැන්ක් යූ කියලා යන්න.